| | | | |
|---|---|---|---|
| දිනය Date – 2025.04.05 පැය 1525 | දුරකථන අංකය Tel.NO – 011-2887973 | මගේ අංකය My NO – D/Media/Out/655/2025 | විද්‍යුත් ලිපිනය E-Mails – dir.media@police.gov.lk |


**වැලිකඩ පොලිස් භාරයේ සිටියදී රෝහල් ගත කරන ලද සැකකරුවෙකු මියයාමේ සිද්ධිය සම්බන්ධ විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වෙත පැවරීම.**

2025.04.01 වන දින රාත්‍රී කාලයේ වැලිකඩ පොලිස් වසමේ නාවල ප්‍රදේශයේ නිවසකට ඇතුළු වී සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසු කලහකාරී ලෙස හැසිරීම හේතුවෙන් නිලධාරීන් විසින් සැකකරු රෝහල් ගත කර ඇත.

මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිස් නිලධාරීන් ක්‍රියා කල ආකාරය සහ රෝහල්ගත කිරීමෙන් පසු සැකකරු මිය යෑමේ සිදුවීම සම්බන්ධව වැඩ බලන පොලිස්පතිතුමාගේ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් 2025.04.04 වන දින සිට විමර්ශන ආරම්භ කරන ලදි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**